# රාජ්‍ය දැව සංස්ථාව

## වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

# පුරප්පාඩු

රාජ්‍ය දැව සංස්ථාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## "ජ්‍යෙෂ්ඨ කළමනාකාර" සේවා ගණය - HM 1-2

### 1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණක)

**වැටුප් පරිමාණය** : HM 1-2 රු.81,670 -2,270X15 - 115,720

**වයස් සීමාව** : වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, 55ට නොවැඩි විය යුතුය

**සුදුසුකම්**

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය / ගණකාධිකරණය / වාණිජ්‍ය / ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ උපාධියක්

සමග

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters') ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ , පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් (Associate Membership) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක , ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් ලබා තිබීම.

II. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ , පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක , ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් ලබා තිබීම.

**වෙනත් පහසුකම් :**

සේවකයන් සහ යැපෙන්නන් සඳහා වෛද්‍ය රක්ෂණ

වාර්ෂික ප්‍රසාද දීමනා

පැමිණීමේ දිරිදීමනාව

නිවාස ණය සහ වෙනත් ණය පහසුකම්

සේ.අ.අ. සහ සේ.භා.අ. සඳහා දායකත්වය

අයදුම්කරුවන් විසින් සම්පූර්ණ විස්තර ඇතුළත් තම අයදුම්පත් ඥාතීන් නොවන දෙදෙනෙකුගේ තොරතුරු හා සහතිකපත් වල පිටපත් සමග 2021.05.10 දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් සභාපති, රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල වෙත ඉදිරිපත් කළ යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය. අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් ජාතික / පළාත් රාජ්‍ය සේවා හෝ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

**සභාපති - රාජ්‍ය දැව සංස්ථාව**

Source: Dinamina, Daily News (2021.04.26)